කොළඹ විශ්වවිද්‍යාලය
ශාස්ත්‍ර පීඨය
ශාස්ත්‍රවේදී තෙවන වසර උපාධි පරීක්ෂණය
දෙවන සෙමෙස්තරය - 2017/2018

**CMS 3246 – මාධ්‍ය හා නිර්මාණාත්මක රචනය**

ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න. කාලය පැය 02 යි.

01. "මානව භාෂාව සතු අප්‍රමාණ ප්‍රකාශන ශක්තියෙහි උපරිම ඵලය නෙළාගන්නේ නිර්මාණශීලී ලේඛකයා ය." සාකච්ඡා කරන්න.

02. නිර්මාණාත්මක ලේඛනය, ශාස්ත්‍රීය හා විඥාපනාත්මක ලේඛනයෙන් වෙනස් වන ආකාරය නිදර්ශන සහිත ව පැහැදිලි කරන්න.

03. "පරිකල්පනයෙහි ලා නිර්මාණාත්මක ලේඛකයා සතු නිදහස සීමා රහිත ය." ඔබට අභිමත නිර්මාණාත්මක රචනා ආශ්‍රයෙන් විග්‍රහ කරන්න.

04. ප්‍රාසංගික කලා, මාධ්‍ය මූලික කලා හෝ නිර්මාණ සාහිත්‍ය කලා ප්‍රවර්ග අතරින් එකක් තෝරාගෙන ඊට අදාළ නිර්මාණාත්මක සංරචක කවරේදැයි පැහැදිලි කරන්න.

05. පුරාණෝක්ති හෝ සූත්‍රිත (Canonical) සාහිත්‍යය පාදක කොටගෙන නිර්මාණය වූ කලාකෘතියක් අලලා එහි මූලික කතා සන්දර්භය නිර්මාණාත්මක ව ගොඩනගා ඇති ආකාරය යෝග්‍ය උදාහරණ ඇසුරින් සාකච්ඡා කරන්න.

06. මාධ්‍ය විෂයක රචනය හා නිර්මාණාත්මක රචනය අතර ඇති වෙනස්කම් උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.

07. වෘත්තාන්ත චිත්‍රපටයක් සඳහා කතා වස්තුවක් තෝරා ගැනීම සහ එය සංවර්ධනය කිරීමෙහි ලා යොදා ගත හැකි ක්‍රමෝපාය ප්‍රායෝගික නිදර්ශන සහිත ව පෙන්වා දෙන්න.